ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1996 අංක 23 දරන ඉඩම් නිරවුල් කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 අගෝස්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1996 අංක 23 දරන ඉඩම් නිරවුල් කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 30/95

ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස ද නිරවුල් කිරීමේ ආඥා ප්‍රතිශෝධනය හෝ අවලංගු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 23 දරන ඉඩම් නිරවුල් කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ, එහි 5 වන වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 463 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(8) (අ) නිරවුල් කිරීමේ දැන්වීමක නිශ්චිතව සඳහන් යම් ඉඩමකට හෝ එවැනි යම් ඉඩමක කොටසකට හෝ සම්බන්ධතාවකට යම් තැනැත්තකු විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් මාස තුනක කාල පරිච්ඡේදය සහ 5 වන වගන්තියේ (1) වන උප වගන්තියේ අතුරු විධානයේ නියමිත යම් වැඩිදුර කාල පරිච්ඡේදයක් ඇත්නම් එම කාල පරිච්ඡේදය ඉකුත් වීමෙන් පසුව, එහෙත් නිරවුල් කිරීමේ දැන්වීමේ නිශ්චිතව සඳහන් ඉඩමේ හෝ එම ඉඩමේ යම් කොටසක් හෝ සම්බන්ධතාවක් පිළිබඳ නිරවුල් කිරීම අඩංගු 5 වන වගන්තියේ (5) වන උපවගන්තියෙන් නියමිත නියමය, 8 වන වගන්තිය යටතේ පළ කිරීමට පෙර යම් වේලාවක, හිමිකම් පෑමක් ඉදිරිපත් කරන්නා වූ; සහ

(ආ) එකී මාස තුනක කාල පරිච්ඡේදය සහ එකී වැඩිදුර කාල පරිච්ඡේදයක් ඇත්නම් ඒ වැඩිදුර කාල පරිච්ඡේදය ඇතුළත එම හිමිකම්පෑම ඉදිරිපත් කිරීමට අසමත්වීමට සාධාරණ හේතු හිමිකම්පාන්නාට තිබූ බවට නිරවුල් කිරීමේ නිලධරයා සෑහීමට පත් වන්නා වූ

අවස්ථාවක දී, මේ ආඥාපනතේ කුමක් සඳහන්ව තිබුණ ද, නිරවුල් කිරීමේ නිලධරයා විසින් එම හිමිකම් පෑම නියමිත කාලය ඇතුළත ඉදිරිපත් කළාක් මෙන් බාරගෙන, ඒ සම්බන්ධව කටයුතු කළ හැකි ය. තව ද, එවැනි අවස්ථාවල දී නිරවුල් කිරීමේ නිලධරයා විසින් ඒ හිමිකම්පෑම සම්බන්ධව කටයුතු කිරීමේ කාර්ය සඳහා ඔහු විසින් 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ප්‍රකාශයක් හෝ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඔහු විසින් ඇතුළත් ව යම් ගිවිසුමක් හෝ වෙනත් හිමිකම්පාන්නන් විමසීමෙන් පසු ශූන්‍ය හා බලරහිත බව ප්‍රකාශ කිරීම නීත්‍යානුකූල වන්නේ ය.".

2—ඩී 040575—6,130 (96/10)

ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එහි 5අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

“ප්‍රකාශය හෝ ගිවිසුම ශුන්‍ය හා බලරහිත බව ප්‍රකාශ කිරීමට නිරවුල් කිරීමේ වුල් කිරීමේ ඇති බලය.

5අ. නිරවුල් කිරීමේ දැන්වීමක නිශ්චිතව සඳහන් ඉඩමක් හෝ එවැනි යම් ඉඩමක යම් කොටසක් හෝ සම්බන්ධතාවක් පිළිබඳව 5 වන වගන්තියේ (1) වන හෝ (4) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් කර ඇති හෝ 5 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ගිවිසුමකට ඇතුළත් වී ඇති නිරවුල් කිරීමේ නිලධරයකුට, එම ප්‍රකාශ කිරීමට හෝ එම ගිවිසුමට ඇතුළත් වීමට පෙරාතුව පවත්වන ලද යම් පරීක්ෂණයක දී ඔහු වෙත ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක නිර්ව්‍යාජ භාවය හෝ යම් සාක්ෂියක සත්‍යතාව ගැන සැක කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු 5 වන වගන්තියේ (5) වන උපවගන්තියෙන් නියමිත නියමය 8 වන වගන්තිය යටතේ පළ කිරීමට පෙර, කවර හෝ අවස්ථාවක එම දැන්වීමේ නිශ්චිතව සඳහන් ඉඩමට හෝ එහි යම් කොටසකට හෝ සම්බන්ධතාවකට හිමිකම්පාන සෑම හිමිකම්පාන්නකු ම එම නිලධරයා ඉදිරියේ පෙනී සිටින ලෙස සහ එම හිමිකම්පාන්නා තම හිමිකම් පෑම ඔප්පු කිරීම සඳහා විශ්වාසය තබන සාක්ෂි කැඳවනු ලැබිය හැකි අතර, එම හිමිකම්පෑම පිළිබඳව අලුතෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු ය ; තව ද, එම පරීක්ෂණයෙන් පසුව එම හිමිකම් පෑම ගැන කටයුතු කිරීමේ කාර්ය සඳහා අවස්ථෝචිත පරිදි 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ නිරවුල් කිරීමේ නිලධරයා විසින් කරන ලද ප්‍රකාශය හෝ 5 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ඔහු විසින් ඇතුළත් වන ලද ගිවිසුම ශුන්‍ය හා බලරහිත බව ඔහු විසින් ප්‍රකාශ කිරීම නීත්‍යානුකූල වන්නේ ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.